අලව්ව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 04 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාලව හඳුන්වාදී ඇති ප්‍රා.ස 14,16,19 වාර්තා පිළියෙල කර එකී වටිනාකම් ලෙජර් ගිණුම්වලට පිටපත් කර ඒ අනුව ගිණුම්ගත කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම් උපචිත පදනමට ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2017 වර්ෂයේ ලැබුණු රු.1,654,659 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ 2016 වර්ෂයට අදාළව ගැලපීම් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.5,500,000 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ සමාලෝචිත වර්ෂයේ ආදායමට ගැලපීම් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාළව ගෙවන ලද රු.49,075 ක් වූ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළව 2017 වර්ෂය තුළ ලැබුණු රු.1,605,945 ක් වූ ප්‍රාග්ධන ආදායම් සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව විසින් තවදුරටත් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.7,874,264 ක් වුවද, ගිණුමේ එම ශේෂය රු.7,967,500 ක් ලෙස දැක්වීමෙන් රු.93,236 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) විදුලි උපකරණ ගබඩා ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ තත්‍ය නිකුත් කිරීම් රු.414,062 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.533,157 ක් ලෙස දක්වා තිබුණි.

**1.3.3** <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.1,773,771 ක නොසැසඳීම් පැවතුණි.

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

**--------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) <u>ලැබියයුතු ගිණුම්</u>

2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.18,241,671 ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂයෙන් රු.11,563,070 ක් වර්ෂයකට වැඩි කාලයකට අදාළ විය.

(ආ) <u>ගෙවියයුතු ගිණුම්</u>

2016 දෙසැම්බර් 31 දිනට රු.21,249,913 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂය තුල වසරකට වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පවතින රු.12,328,470 ක් විය.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

රු.427,900 ක් වටිනා ඉඩම් කට්ටි 14 ක ඔප්පු/ පැවරුම් සහතික සහ රු.20,585,063 ක් වටිනා ගිණුම් විෂයයන් 06 ක ලේඛන හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදි සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

### 1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

-------------------------------------------------------

2011 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාව ස්ථාපිත කරන ලද අවස්ථාවේ මුදල් පොතේ ශේෂයන් හා ලෙජර් ගිණුම් ශේෂයන් අතර පැවති රු.2,618,854 ක වෙනස ගිණුම්කාරක සභා තීරණයක් අනුව ජර්නල් සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණද, ජර්නල් සටහන් මගින් 2016 ජනවාරි 01 දිනට පැවති ශේෂය වූ රු.3,136,098 ක වටිනාකම ගිණුම්වලින් ඉවත් කර තිබුණි. මේ අනුව රු.517,244 ක ප්‍රමාණයක් නිසි අධිකාරි බලයක් නොමැතිව මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.21,623,593 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.9,349,140 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,274,453 ක වර්ධනයක් සිදු වී තිබුණි.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

කුලී, වෙනත් ආදායම් හා වැටුප් ප්‍රතිපූර්ණ ආදායම් පිළිවෙලින් රු.3,064,053 ක් රු.3,065,040 ක් සහ රු.5,607,384 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

----------------------

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

------------------------------------

සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 89 ක ආදායමක් රැස් කිරීමට ඇස්තමේන්තුගත කර තිබූ අතර, එම ප්‍රමාණයම රැස්කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු රුපියල් මිලියන 19 න් 2016 වර්ෂය තුළ රුපියල් මිලියන 6 ක් පමණක් රැස්කරගෙන තිබුණි.

### 2.3.2 වරිපනම්

---------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පැවති වරිපනම් ඒකක 4212 ක් සඳහා රු.2,084,321 ක් 2016 වර්ෂයට බිල්කර තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟය රු.1,181,887 ක් විය. එය සමස්ථ ලැබිය යුතු වරිපනම් ආදායමෙන් සියයට 57 ක්වූ අතර ආරම්භක හිඟ මුදලින් අයවී තිබුනේ රු.534,511 ක් හෙවත් සියයට 38 ක් වැනි අඩු ප්‍රතිශතයකි.

### 2.3.3 කඩ කුලී

----------

අලව්ව නගරයේ නව පොදු වෙළඳපල ගොඩනැගිල්ලේ කඩ කාමර 15 ක් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට බදුකරුවන් වෙත ලබා දී තිබුණද , 2017 වර්ෂයේ ජනවාරි වන විටද එම බදු දීම් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් රු.2,658,812 ක මුද්දර ගාස්තු සහ රු.9,611,639 ක උසාවි දඩ මුදලක් අයවිය යුතුව තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

අලව්ව ප්‍රාදේශීය සභාවට විවිධ පාර්ශවයන්ගෙන් ලැබෙන ප්‍රතිපාදන භාවිතා කර ඉටු කරන කර්මාන්තද ඇතුළත්ව කර්මාන්ත ලේඛනයක් විධිමත්ව නඩත්තු කර නොතිබුණු බැවින් සහා අරමුදල් හැර වෙනත් පාර්ශවයන්ගෙන් ලද ප්‍රතිපාදනවල විස්තර ඇතුළත් කර්මාන්ත සම්බන්ධ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කල කර්මාන්ත ලේඛනයෙන් වෙන් වෙන්ව හඳුනාගත නොහැකි විය.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් කට්ටිවල ආරක්ෂිත වැටවල් ගසා මායිම් ලකුණු කර සභාව සතු බවට දැන්වීම් පුවරුවක් සවිකර එළදාව බදු දීමට කටයුතු කර නොතිබූ අතර ඔප්පු නොමැති හෝ භෞතිකව හඳුනාගත නොහැකි වූ ඉඩම් කට්ටි 12 ක් විය.

(ආ) අට්ටික්කාගහමුල වත්ත නැමැති රූඩ් 03 පර්චස් 19 විශාල ඉඩම අනුමැතියකින් තොරව කට්ටි කර විකුණා තිබුණි.

**3.3 හඳුනාගත් අලාභ**

රුපියල් මිලියන 70 ක් වැය කර අලව්ව නව බස් නැවතුම්පල හා කඩ කාමර 28 කින් යුත් නව වෙළඳ සංකීර්ණය ඉදිකර 2016 අගෝස්තු මාසයේ කඩ කාමර 15 ක් පමණක් බදු දී තිබූ අතර 2017 ජනවාරි මාසය වන විටද ඉතිරි කඩ කාමර 13 බදු දීමට කටයුතු කර නොතිබීම නිසා සභාවට උපයාගතව හැකිව තිබුණු ආදායමක් අහිමි කර ගෙන තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද කර්මාන්ත 05 ක ඇස්තමේන්තුවල , මිනුම් වාර්තාවල, ප්‍රමාණපත්‍ර වල හා ගෙවීම් වාර්තාවල සකස් කල , පරීක්ෂා කල , නිර්දේශ කල හා අනුමත කල

නිලධාරීන් එම වාර්තාවල වගකිව යුතු නිලධාරීන් වශයෙන් අත්සන් කර තිබුණද, අදාළ දිනයන් සඳහන් නොකිරීම බහුලව පැවතුණි.

(ආ) අලව්ව ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ වහලය සහිත කොම්පෝස්ට් අංගනය හා වහලය රහිත කොන්ක්‍රීට් අංගනය ඉදි කිරීමේ කර්මාන්තයේ දිග මීටර් 13.4 හා පළල මීටර් 9.45 ක කොටස සඳහා වූ වහලය වෙනුවෙන් සින්ක් ඇලුමිනියම් පීළි සවිකර නොතිබුණු අතර, 4"x2"x2"Cපර්ලින් ඉදි කිරීම යකඩවලින් නිමවා ඒ සඳහා මළ නිවාරණ තීන්ත අලේප කර නොතිබුණි. මීටර් 10.7 ක් හා පළල මීටර් 9.45 ක කොටස ඉදි කිරීම සඳහා යොදා තිබූ 4"x2"x2"Cපර්ලින් සඳහා ගැල්වනයිස් වර්ගය භාවිතා කර තිබුණි. එහි මළ නිවාරණ තීන්ත අලේප කර නොතිබුණි.

## 3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

---------------------

2016 ඔක්තෝබර් 20 දින ගිවිසුම් අත්සන් කරන ලද ඇස්තමේන්තු ගත වටිනාකම රු.1,502,611 ක් වු බෝපිටිය පෙර පාසැල් ගොඩනැගිල්ල ඉදි කිරීම් කර්මාන්තයට ද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකිවීම හේතුවක් වශයෙන් දක්වා කර්මාන්තය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිමකර නොතිබුණි.

## 3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සභා බල ප්‍රදේශයට අයත් සියළුම කසළ දෛනිකව එක්රැස් නොකරන අතර නාගරික ප්‍රදේශයෙන් එක්රැස් කරන කසළ වලින් ට්‍රැක්ටරයක් පමණක් පොහොර නිෂ්පාදනයට යොදවා ඉතිරි ප්‍රමාණය ප්‍රදේශයේ විශාල වලකට බැහැර කරන බව නිරීක්ෂණය විය.

## 3.7 පාරිසරික ගැටළු

-----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අලව්ව ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය පිහිටි භූමියට යාබදව පිහිටි රක්ෂිත වනාන්තරයකට වර්ෂ කිහිපයකට පෙර වෙන් නොකරන ලද කසල බැහැර කිරීම හේතුවෙන් රක්ෂිතයේ වූ රුස්ස ගස් 12 ක් පමණ මැරී තිබුණි. කසල විධිමත්ව බැහැර නොකිරීම හේතුවෙන් කුඹුරු යායේ මායිම දක්වාද කසල ගලාගෙන ගොස් රැස්වී තිබුණි. මේ හේතුවෙන් විශාල පාරිසරික හා සමාජීය හානියක් සිදුව තිබුණි. එසේම වර්තමානයේදී නාගරික ප්‍රාදේශවලින් පමණක් කසල එක් රැස් කරන අතර එම එකතු කරන ලද මුළු ප්‍රමාණය කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා භාවිතා කළ නොහැකි බැවින් ප්‍රදේශයේ ගඩොල් කැපීම සඳහා පස් ලබා ගන්නා වලවල්වලට කසල බැහැර කිරීම සිදු කරමින් පැවතුණි.

(ආ) 2016 වර්ෂයේ මාර්තු මාසයේදී ඉදි කිරීම් අවසන් කර තිබෙන අලව්ව බස් නැවතුම්පල පොදු වැසිකිලියෙහි අපද්‍රව්‍ය එකතුවන වල ප්‍රමාණවත් පරිදි විශාලව සකස් නොකිරීම හෝ ප්‍රමිතියට අනුව නිම නොකිරීම යන කුමන හෝ හේතුවක් මත වැසිකිළියේ අපද්‍රව්‍ය නිතරම උතුරා ගොස් අලව්ව නගරයේ ප්‍රධාන කාණුවට එකතු වීමක් සිදුවන බැවින් ගලි බවුසර් යොදා ගනිමින් වැසිකිලි අපද්‍රව්‍ය නිරන්තරයෙන් ඉවත් කිරීමට සභාවට සිදු වී තිබුණි.

(ඇ) අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2016 වර්ෂය සඳහා නව පරිසර බලපත්‍ර නිකුත් කිරීම් 28 ක් හා අළුත්කිරීම් 64 ක් පැවති අතර ආසන්න වර්ෂ තුනක පරිසර බලපත්‍ර අළුත් කිරීම් හා නිකුත් කළ ප්‍රමාණ සැසඳීමේදී පරිසර බලපත්‍ර අළුත් කිරීම් සිදු නොකර ක්‍රියාත්මක වන ව්‍යාපාර ආයතන 66 ක් පවතින බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපාර ආයතනවල අදාල පරිසර බලපත්‍ර අලුත් නොකිරීම තුල එම ව්‍යාපාර ආයතන තවදුරටත් පවත්වාගෙන යන්නේද , නැද්ද යන්න පරීක්ෂා කර තහවුරු කර ගැනීමට සහ අදාල පරිසරික ගැටළු වැලැක්වීමට හෝ අවම කිරීමට පියවර ගෙන නොතිබුණි.

**04 ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

-------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

2016 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනය මඟින් වැය විෂයයන් 14 කට සලසා තිබුණු රු.1,010,000 ක් වූ ප්‍රතිපාදන මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබීම තුළ අරමුණුගත කාර්යයන් ඉටුකර නොතිබෙන තත්ත්වයක් නිරීක්ෂණය විය.

**05 පද්ධති හා පාලනය**

--------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ අඩුපාඩු වරින් වර ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ජංගම වගකීම් අඩුවෙන් ගිණුම්ගත කිරීම. |
| | ජංගම වත්කම් අඩුවෙන් ගිණුම්ගත කිරීම. |
| | ජර්නල් සටහන් පවත්වා නොගැනීම. |
| | වර්ගීකරණ දෝෂ. |

| | |
|---|---|
| | ලේඛන හා ගිණුම් සමග ඉදිරිපත් කර ඇති උප ලේඛන අතර වෙනස්කම් පැවතීම.<br>කර්මාන්ත ලේඛනය හා ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට අදාළ ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම. |
| (ආ) ආදායම් පාලනය | ලැබිය යුතු හිඟ ගාස්තු අය කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) අයවැය පාලනය | එක් එක් වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන සිදු කළද ඒවා මුළුමනින්ම ඉටු නොකිරීම. |
| (ඉ) කසළ කළමණාකරණය | කසල වර්ගීකරණයකින් තොරව භාර ගැනීම , කසල ක්‍රමවත්ව බැහැර නොකිරීම නිසා පාරිසරික ගැටළු පැන නැගී තිබීම. |
| (ඊ) පරිසර බලපත්‍ර නිකුත් කිරීම / අළුත් කිරීම | පරිසර බලපත්‍ර ලබා නොගෙන පවත්වාගෙන යන ව්‍යාපාර පැවතීම හා ඒවා පරීක්ෂාවට ලක් නොකිරීම. |